175

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරන සහතික පත්‍ර වැඩසටහන
අවසාන පරීක්ෂණය 2008/2009
මෙහෙයුම් කළමනාකරණයට හැඳින්වීම – MCC 1105
කාලය : පැය දෙක (02) යි.

| | |
|---|---|
| දිනය : 2008 දෙසැම්බර් 21 | වේලාව : පෙ.ව.10.00 මධ්‍යාහ්න 12.00 දක්වා |

ඕනෑම ප්‍රශ්ණ 4 කට පිළිතුරු සපයන්න.
සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ඇත.

1. (අ) ඔබ කුඩා පරිමාණ නිෂ්පාදනයක නිරතව සිටින ව්‍යවසායකයෙකු යයි උපකල්පනය කරන්න. මෙහෙයුම් කළමනාකරණය පිළිබඳව ඇති දැනුම ඔබට උපකාරි විය හැක්කේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 12)

(ආ) වර්තමානයේදී මතුවන ව්‍යවසායකයන් බොහෝ ගැටළුවලට මුහුණ දේ. ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ව්‍යවසායකයන් මුහුණ දෙන වත්මන් මෙහෙයුම් සම්බන්ධ ගැටළු සාකච්ඡා කරන්න.
(ලකුණු 13)

2. (අ) සෑම නිෂ්පාදක පද්ධතියකම සාර්ථකත්වය රදා පවතිනුයේ ඒවායේ සැලසුම,' සංවිධානකරණය සහ පාලනය මත වේ. ඔබට සමීප නිෂ්පාදනයක් තෝරාගෙන ඔබ සැලසුම් කිරීම, සංවිධානකරණය සහ පාලනය කරන්නේ කෙසේදැයි විස්තර කරන්න.
(ලකුණු 12)

(ආ) නිෂ්පාදන නිර්මාණකරණය සහ ඉංජිනේරුකරණය වැනි කාර්යයන්ගෙන් නිෂ්පාදන සංවර්ධනය සමන්විත වේ. ඔබට හුරුපුරුදු ඕනෑම නිෂ්පාදනයක් සඳහා ඔබගේ නිර්මාණය ඉංජිනේරුකරණය කරන්නේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 13)

3. නිෂ්පාදකයෙකුට වෙළඳපොල (ඉල්ලුම) තොරතුරුවල වැදගත්කම පැහැදිලි කරන්න. තවද වෙළඳපොල පිළිබඳ තොරතුරු එකතු කර ගැනීම සඳහා උපයෝගී කර ගත හැකි මූලාශ්‍ර විස්තර කරන්න.
(ලකුණු 25)

4. (අ) සෑම නිෂ්පාදකයෙකුම සිය සංවිධානයේ නිෂ්පාදකතාව පිළිබඳව බොහෝ සැලකිලිමත් වේ. ඔබ කුඩා පරිමාණ කිරි ගොවිපලක් ආරම්භ කිරීමට අදහස් කරන්නේ යයි උපකල්පනය කර එම ආයතනයෙහි නිෂ්පාදකතාව උපරිම කිරීම සහතික කරන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.
(ලකුණු 10)

5. (ආ) අඹ යුෂ බීම බෝතලයක් නිෂ්පාදනය සඳහා වන පිරිවැය පිළිබඳ විස්තර පහත දී ඇත. එක් අඹ යුෂ බීම බෝතලයක් සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කරන්න.

අඹ භාවිතය – රු.20/- බැගින් අඹගෙඩි 02

ශ්‍රම භාවිතය - කම්කරුවනත් දෙදෙනෙකු අවශ්‍ය අතර ඔවුන් පැය 2 ½ ක් වැඩ කළ යුතු වේ වැටුප එක් කම්කරු පැයකට රු. 25/.කි.

අඹ යුෂ බීම බෝතලයක් සඳහා වන වෙනත් වියදම් –

බලශක්තිය හා ඉන්ධන වෙනුවෙන් - රු. 30/.

වෙනත් නිෂ්පාදන වියදම් - රු. 25/. (ලකුණු 12)

(ඉ) ඉහත 4 (ආ) හි අඹ යුෂ බීම නිෂ්පාදකයා නිෂ්පාදන පිරිවැය මත 50% ක ලාභ ආන්තිකයක් එකතු කරයි නම් විකුණුම් මිල තීරණය කරන්න.

(ලකුණු 03)

6. පහත ඒවායින් ඕනෑම <u>පහක් (5)</u> සම්බන්ධයෙන් කෙටි සටහන් ලියන්න.

(අ) මෙහෙයුම් කළමනාකරණයේ වර්ධන ප්‍රවනතා

(ආ) ක්‍රියාවලි සැකැස්ම

(ඉ) වැඩ මැනීම

(ඊ) නිපදවීමේ හෝ මිලදී ගැනීමේ තීරණය

(උ) නිෂ්පාදන පාලන පද්ධති

(ඌ) කම්හල් බිම් සැකසුම් තීරණ

(එකකට ලකුණු 5 බැගින් x 5 = 25).

\- සියළුම හිමිකම් ඇවිරිණි -